




සිසිර දිසානායක

# තොරතුරු තාක්ෂණයේ අපේ විරුවෙක් !

අලුතෙන් මෙහේ පදිංචියට එන අයට මේ දවස්වල රස්සාවල් ප්‍රශ්නය ටිකක් දැනෙනවා වගේ. පැන්සලත් රස්සාවල් හොයන අය අතරට එකතුවෙලා. පැන්ගේ ප්‍රධාන කාරිය වෙලා තියෙන්නේ රස්සාවලට ඉල්ලුම් කරන එක. හැමතැනින්ම අහන්නේ "ලෝකල් එක්ස්පීරියන්ස් එක. (Local Experience) නැත්නම් මෙහේ පළපුරුද්ද. මෙහේ රස්සාවක් නොලැබී කොහොමද ඒක ලැබෙන්නේ ?

පැන්ට තමන්ගේ අතීතය මතක් වුණා. ඉගෙන ගත්තු තැන්; රස්සාවල් කරපු තැන්. ඔන්න එතකොටයි පැන්ට මතක් වුණේ. කාලෙකට ඉස්සර මුණගැහුණ මහත්තැන් කෙනෙක් එක් කරපු සාකච්ඡාවක් ගැන පන්හිඳයි , පින්සලයි ලියන, අදින ලිපි පෙලට එක්කරන්න වටිනා සාකච්ඡාවක් ඒක. ඒ අයගේ ඉල්ලීම වෙලා තිබුණොත් පෑන්ටත් ඒ දේවල්වලට සම්බන්ධ වෙන්න නේ. හොඳ වේලාවට ඒ සාකච්ඡාව ටේප් කරගත්ත කැසට් පටියක් පෑන් ගාව තිබුණා. "හොඳ වේලාවට .." පෑන්ට කියවුණා.

ශ්‍රී ලංකාවේ ඉංජිනේරු ක්ෂේත්‍රයේ කවුරුත් පාහේ අඳුනන ඇදුරුතුමෙක් වෙන මහාචාර්ය සමරජීව කරුණාරත්න මහත්තයා පෑන්ට මුණ ගැහුණේ මෙල්බර්න්වල ඉන්න එතුමාගේ බාල සොහොයුරු රෝහහ කරුණාරත්න මිත්‍රයාගේ ගෙදරදියි. කලා ක්ෂේත්‍රයේ වගේම අධ්‍යාපන ක්ෂේත්‍රයෙත්, මාධ්‍ය වලත් නිතර අහන්න දකින්න ලැබෙන මහාචාර්ය කුසුමා කරුණාරත්න මහත්මියයි. එතුමාගේ ප්‍රිය බිරිඳ. සමරජීව මහාචාර්යවරයාව කවුරුත් කෙටියෙන් හැඳින්වුයේ ප්‍රොෆෙසර් සෑම් කියලයි.

"සමරජීව" නම ඉංග්‍රීසියෙන් ලිව්වම එන මුල් අකුරු SAM නිසයි ඒ කෙටි නම හැදුනේ. පැන්සල ලියන්න පටන් ගත්තා.

සෑම් කරුණාරත්න මහාචාර්යවරයා සිය රැකියාව ඇරඹුවේ මොරටුව විශ්ව විද්‍යාලයීය කථිකාචාර්යවරයෙකු වශයෙනි. වසර තිස්තුනක කාලයක් තිස්සේ විදුලි ඉංජිනේරු අංශයේ මහාචාර්යවරයෙකු ලෙස කටයුතු කල එතුමා විශ්‍රාම යනවිට එම විශ්ව විද්‍යාලයේම උපකුලපති තනතුර හෙබවීය. ඒ අතරතුරදී ඉංජිනේරු හා වාස්තු විද්‍යා පීඨයේ පීඨාධිපති තනතුර ද දැරීය.

ශ්‍රී ලංකාවේ පරිගණක තාක්ෂණ අංශයේ මුල්ම හා පුරෝගාමී පුද්ගලයෙකු වශයෙන් මහාචාර්යවරයා වෙනත් ආකාරයකින් හඳුන්වා දිය හැකියි. වර්ෂ 1967 දී ලංකාවට මුලින්ම ආනයනය කරන ලද පරිගණක පද්ධතිය හඳුන්වා දෙමින් විශාල පරිමාණයේ ජාලයක් ස්ථාපිත කිරීමෙහිලා මූලිකව කටයුතු කලේ එතුමායි. රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ කටයුතු සඳහා වූ එකී පරිගණක ජාලය ඇසුරින් 15,000 ක් පමණ වූ සේවකයින් හා 250"300 ක් පමණ වූ ඉංජිනේරුවන් පිරිසකගේ සියලු දත්ත පරිගණක ගත කෙරිණ. සියලු ගොඩනැගිලි ඉදිකිරීම් සැලසුම් කිරීම් ද ඒ ඇසුරින් කල බවයි මහාචාර්යවරයා පැවසුයේ.

"පරිගණක විද්‍යාව පිළිබඳව ලංකාවේ ලියවුණ මුල්ම පොත වුනේ මම ලියපු පොතක්. ඒ එක්දස් නවසිය හැට අටේ අවුරුද්දෙදි."

"ඉස්සර වෙන වෙනම විශ්ව විද්‍යාල තිබුනේ නෑ. තිබුනේ ලංකා විශ්ව විද්‍යාලය කියලා, එකයි. 1960 දී මම ලංකා විශ්ව විද්‍යාලයට ඇතුලත් වුනා. ඊට අවුරුදු තුනකට පස්සේ විදේශ ගතවෙන්න සිද්ධ වුනා. වැඩිදුර අධ්‍යාපන කටයුතුවලට. ඒ ගිහින් ඇවිත් තමයි අර මුල්ම පරිගණක ජාලය සම්බන්ධව වැඩ කලේ. ඊට අවුරුදු දෙකකට පස්සේ තමයි මට එය මහාචාර්ය පදවිය මොරටුව විද්‍යාලයෙන් පිරිනැමුවේ. ඒ කාලේ 'කටුබැද්ද කැම්පස්' කියලයි කිව්වේ. පීඨාධිපති විදියට මම හිටියේ අවුරුදු හතරක විතර කාලයක්. ඉතින් අවුරුදු තිස්තුනක කාලයක් තිස්සේ මගෙන් ඉගෙන ගත්ත ඉංජිනේරුවරු බොහෝමයි. මං හිතන්නේ එයින් සියයට දහයක් විතරම ඉන්නේ ඕස්ට්‍රේලියාවේ...."

ඊට අමතරව මම වසර දහයක් විතර ආතර් සී ක්ලාක් ආයතනයේ අධ්‍යක්ෂවරයා විදියට කටයුතු කලා. ඒ අතරතුර ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ සභාපතිවරයා විදිටයත් කටයුතු කලා. පස්සේ මම අළුත් ආයතනයක් බිහි කලා. ඒ තමයි ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් ඉන්ෆෝමේෂන් ටෙක්නොලොජි (Sri Lanka Institute of Information Technology) නැත්නම් "ස්ලිට්" (SLIT) කියන ආයතනය. විශ්‍රාම ගත්තට පස්සේ 2000 අවුරුද්දෙයි " ස්ලිට්" ආයතනය පටන් ගත්තේ. ශිෂ්‍යයින් 400ක

කර්ටන් යුනිවර්සිටි ඔෆ් ටෙක්නොලොජි, ආර්. එම්. අයි. ටී. ඩීකින්, ස්වින්බර්න් වාගේ විශ්ව විද්‍යාල ඉන් සමහරක්. ඇත්තටම මේ රටට ඇවිත් ඉගෙන ගන්න වියදම් කරන්න අපහසු අයට ඒක ලොකු සහනයක් !
තොරතුරු තාක්ෂණ අංශය හරි වැදගත්. මෘදුකාංග (Software) අපනයනය කරන එකෙන් ලංකාව දැනට ඩොලර් මිලියන 250 ක් පමණ හොයනවා. අපේ බලාපොරොත්තු මේ ආදායම හතර ගුණයක් දක්වාවත් ඉහල නංවාගන්න. ඒ කියන්නේ ඩොලර් බිලියනයක් දක්වා ඉතින් ඒකට අවශ්‍ය ප්‍රමාණයට උපාධිධාරින් රටෙන් බිහිවෙන්න ඕන. උපාධිධාරීන්ට



ගෙන් විතර පටන් ගත්ත මේ ආයතනයේ දැනට ශිෂ්‍යයින් පන්දහක් විතට අධ්‍යාපනය ලබනවා."

මාලඹේ " කඩුවෙල මාර්ගයේ පිහිටා ඇති ස්ලිට් ආයතනයෙන් බිහිවන පරිගණක තාක්ෂණ ඉංජිනේරුවෝ වැඩසටහන් සැලසුම් කරන්නේ අද මව්බිමේ පමණක් නොව විදේශයන්හි පවා එම අංශයේ රැකියාවන්හි යෙදී සිටිති.

"ස්ලිට්" තොරතුරු තාක්ෂණය පිළිබදව උපාධි පිරිනමන මව්බිමේ තියෙන විශාලම ආයතනය බවට අද පත්වෙලා තියෙනවා. "මාලඹේ කැම්පස්" එකට අමතරව කොල්ලුපිටියේත් කොටසක් තියෙනවා. ඒ ඇරණාම නුවර, මාතර වාගේ නගරවලත් මධ්‍යස්ථාන පිහිටවලා තියෙනවා. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂමෙන් මේ උපාධි පිරිනමන්නට අනුමැතිය ලබා දීලා තියෙනවා. විදේශ විශ්ව විද්‍යාලවල පවත්වාගෙන යන තොරතුරු තාක්ෂණ පාඨමාලා පවත්වන්නටත් අපි අවසර ලබාගෙන සාර්ථකව කරගෙන යනවා. ඕස්ට්‍රේලියාවේ

අමතරව තාක්ෂණ ක්‍රම (info Systems), තාක්ෂණ කළමනාකරණය (Info Management), තොරතුරු තාක්ෂණය (Info Technology), සම්පත් වර්ධනය (Resource Development) වගේ ශාස්ත්‍රපති උපාධිධාරින්වත් (Masters) බිහිකිරීම තමයි අපේ අරමුණ" මහාචාර්වරයාගේ කටහඬ, හඬ පටයෙන් මැකිලා ගියා.

පන්"පින් දෙන්නාත් වැඩ ඇරිලා ඇවිත් ගෙට ගොඩ වුනේ එකටම වාගේ.

"අපි ඩැංඩිනොං බේකරියෙන් රෝස් පාන් ගෙනාවා !"

හොඳ වේලාවට ! පුරුද්දට වාගෙ පෑන් කියවුණා. "මාත් හරි බඩගින්නේ උන්නේ." පෑන් ගිහින් විදුලි කේතලය පයිප්පයට ඇල්ලුවේ වතුර ටිකක් උණු කරන්න හිතාගෙන

■




